# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2418/49 - 2025 ජනවාරි මස 11 වැනි සෙනසුරාදා - 2025.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/67

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

රක්ෂණ සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

සහ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද ,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා ) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතර, පඹුරන, අබේගුණරත්න මාවත, අංක 10A, ඒ. ඒ. වීරසූරි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු ,**
කම්කරු අමාත්‍ය.

2025 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

---


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක*

මගේ අංකය: IR/ COM/03/2023/67

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

රක්ෂණ සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

සහ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ

“ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් 2022-2025 කාලසීමාව සඳහා අනුමත කර ඇති සේවකයන්ගේ වැටුප් වැඩිකිරීමේ ක්‍රමවේදය අනුව ආයතනය සමඟ තනි තනිව ගිවිසුම්ගත නොවූ පහත නම් සඳහන් සේවකයන් පස් දෙනා සඳහා එම වැටුප් වැඩි කිරීම ලබා නොදීම මගින් එම සේවකයන්ට යම් අසාධාරණයක් සිදුවී තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම්, ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.’’

1. එන්.ජේ.එස්.එස්. පෙරේරා
2. ජී.එම්.ආර්.එස්.ගජනායක
3. ඒ.ටී.බද්දෙවිතාන
4. ඒ.ඒ.ඩී.ප්‍රියංකර
5. ඊ.ඩබ්.යූ.ආර්.දිවාකර

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG01– 0109